# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No – 10120

ෆැක්ස් / தொலைநகல / Fax – 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone – 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site – www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail – dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO – 945/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No – / 2024

දිනය / திகதி / Date – 05/06/2024 පැය 1100

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.06.04 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 04 | 04 | 63 | 35 | යකඩ බැරල් 03<br>තඹ දඟර 03<br>බට 02<br>කෑන් 01 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. නීතිවිරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි සමඟ අත්අඩංගුවට ගැනීම - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

2024.06.04 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැල්ලම්පිටිය පොලිස් වසමේ කොලොන්නාව ප්‍රදේශයේදී තීරුබදු රහිතව නීති විරෝධීව මෙරටට ගෙන්වන ලද දුම්වැටි 6000 ක් සමඟ අත්අඩංගුවට ගෙන වැල්ලම්පිටිය පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 46 ක් වූ කොලොන්නාව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** වැල්ලම්පිටිය පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර.**

2024.06.04 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මුලතිව් කඳවුර නිලධාරීන් කණ්ඩායමක් විසින් සෙට්ටිකුලම් පොලිස් වසමේ නේරියකුලම් ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 50 ක් හා යතුරුපැදියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන සෙට්ටිකුලම් පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 21 ක් වූ සෙට්ටිකුලම් ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ. සෙට්ටිකුලම් පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**